# සිංහල

## 4 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# 8 පාඩම
## ' මම' හා ' අපි ' යෙදුණු වතර්මාන හා අතීත කාල වාක්‍ය ලියමු.

ක්‍රියාකාරකම 1

**පියවර 1**

- පාට හතරකින් A4 කොළ හතරක් ගනිමු.
- පහත දී ඇති මාතෘකා කොළයේ ඉහළ කොටසෙහි ලියමු.

<u>මාතෘකා</u>

'මම' යෙදුණු වතර්මාන කාල වාක්‍ය
'මම' යෙදුණු අතීත කාල වාක්‍ය
'අපි' යෙදුණු වතර්මාන කාල වාක්‍ය
'අපි' යෙදුණු අතීත කාල වාක්‍ය

**පියවර 2**

- ඉන්පසු ව පහත දී ඇති වාක්‍ය කඩදාසි තීරුවල ලියා ගනිමු.

01. මම පාසල් යමි.
02. මම පාඩම් කළෙමි.
03. මම බත් කමි.
04. අපි කෑමට පෙර අත් සෝදමු.
05. මම පිරිසිදු වතුර බිව්වෙමි.
06. අපි මල් කඩමු.
07. මම පාඩම් කරමි.
08. අපි තාලයට නටමු.
09. අපි නිවැරදිව අකුරු ලියමු.
10. මම පිරිසිදු වතුර බොමි.
11. අපි විනෝද චාරිකාවක් යමු.
12. මම සතුටු වුණෙමි.
13. අපි විනෝද චාරිකාවක් ගියෙමු.
14. මම සතුටු වෙමි
15. අපි මල් කැඩුවෙමු.
16. අපි නිවැරදිව අකුරු ලිව්වෙමු.
17. මම පාසල් ගියෙමි.
18. අපි තාලයට නැටුවෙමු.
19. මම බත් කෑවෙමි.
20. අපි කෑමට පෙර අත් සේදුවෙමු.

**පියවර 3**

- මාතෘකා ලියා සකසාගත් පත්‍රිකාවලට ගැළපෙන පරිදි ලියූ වාක්‍ය වගර් කර ගනිමු.

**පියවර 4**

- වගර් කරගන්නා ලද වාක්‍ය සඳහන් තීරු A4 කඩදාසිවල අලවමු.

**පියවර 5**

එම වාක්‍ය ශබ්ද නඟා කියවමු.